**සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුව**

**ප්‍රසම්පාදන දැන්වීමයි**

**සුනඛ වන්ද්‍යාකරණය කිරීම - 2025**

ඌව පළාතේ බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| අ.අ. | දිස්ත්‍රික්කය | වන්ධ්‍යාකරණය කළ යුතු සුනඛයින් ගණන | ලංසු සුරක්ෂණය | ආපසු නොගෙවන ලංසු ආකෘතිපත්‍ර ගාස්තු |
|---|---|---|---|---|
| 01. | මොණරාගල දිස්ත්‍රික්කය | 300 | රු. 40,000.00 | රු. 3,500.00 |
| 02. | බදුල්ල දිස්ත්‍රික්කය | 300 | | |

ඉහත වගුවේ සඳහන් පරිදි ලංසු ආකෘතිපත්‍ර ගාස්තු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුවේ මුදල් සහකාර වෙත මුදලින් ගෙවීම් කර රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලංසු අයදුම්පත්‍ර ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුවෙන් නිකුත් කරනු ලැබේ. 2025.08.19 දින සිට 2025.09.01 දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පස්වරු 03.30 දක්වා ලංසු ආකෘති පත්‍ර නිකුත් කරන අතර, මුදල් භාර ගනු ලබන්නේ සතියේ වැඩ කරන දිනවලදී පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා පමණි. ලංසු සුරක්ෂණ ගාස්තු සඳහා බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් ඉහත ලංසු සුරක්ෂණ ගාස්තුව මෙන් දෙගුණයක් විය යුතුය.

- පශු වෛද්‍ය වරුන්ගේ සංගමයේ ලියාපදිංචිය හා වසර දෙකක සේවා පල පුරුද්දක් ඇති ආයතන හෝ පුද්ගලයින් සඳහා ඉල්ලුම් කිරීමට හැකිය.

- සියලුම ගෙවීම් මුදලින් පමණක් භාරගනු ලැබේ.පිටපත් 02 කින් යුතුව නිකුත් කරනු ලබන ලංසු ආකෘතිපත්‍ර නිසි අයුරින් එකම ආකාරයකට සම්පූර්ණ කර තිබිය යුතුවේ. ලංසු ආකෘති පත්‍ර යුගලය එනම් මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා මෙම කවර දෙක එක් කවරයක බහා කවරයේ වම් පස ඉහල කෙලවරේ **"සුනඛයින් වන්ද්‍යාකරණය කිරීම - 2025"** යනුවෙන් සඳහන් කර , ඊට පහලින් අයදුම්කරුගේ නම හා ලිපිනය සඳහන් කළ යුතුවේ.

- මුද්‍රා තබන ලද ලංසු 2025.09.02 දින ප.ව. 2.00 ට පෙර ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටිය බහාලිය යුතුවේ. නැතහොත් එකී වේලාවට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුව, අංක 301,ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ අයදුම් පත්‍ර හා නියමිත දින නියමිත වේලාවෙන් පසු ලැබෙන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ලැබී ඇති සියලුම ලංසු 2025.09.02 දින ප.ව. 2.30ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලය ඉදිරිපිටදී විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු පත් ඉදිරිපත් කළ ලංසුකරුට හෝ ඔහු /ඇය විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයකු සහභාගි කරවිය හැකි අතර ඔහු තම අනන්‍යතාවය තහවුරු කිරීමට සමත් විය යුතුය.

- සතියේ වැඩ කරන දින, කාර්යාල වේලාව තුල ලංසු ආකෘති පත්‍ර පරීක්ෂා කල හැකි අතර, ඕනෑම ලංසුවක් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ.

- මේ පිළිබඳ වැඩිදුර විස්තර මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.up.gov.lk වෙබ් ලිපිනයට පිවිසීමෙන් ලබා ගත හැකිය.

සභාපති - දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තුමේන්තුව,
3 වන මහල , අංක 301,ආර්.එච්.ගුණවර්ධන මාවත,
බදුල්ල.
දුරකථන අංක :- 055-2231981 ෆැක්ස් අංක :- 055-2223098